ප්‍රවෘත්ති නිවේදනය | ஊடக வெளியீடு | PRESS RELEASE
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
Ministry of Health & Mass Media
No. 385, Ven. Baddegama Wimalawansa Thero Mawatha, Colombo - 10
Tel: off: 2671181 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540

2025.09.03

| | |
|---|---|
| 09 | 03 |

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති කර්තෘ / ප්‍රවෘත්ති සංස්කාරක,
පහත සඳහන් ප්‍රවෘත්තියට ඔබ මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

## රජයේ රෝහල් 15ක් සඳහා අති නවීන ආසාධිත අපද්‍රව්‍ය දාහක යන්ත්‍ර ...

### ප්‍රථම ඒකකය ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ ස්ථාපිත කිරීම අනිද්දා (2025.09.05)

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JAICA) මගින් ආසාධිත අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ ස්ථාපිත කරන ලද අති නවීන ආසාධිත අපද්‍රව්‍ය දාහක යන්ත්‍රය (Incinerator) මෙම මස (05) දින පෙරවරු 10.00 ට සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතාගේ ප්‍රධානත්වයෙන්, නැගෙනහිර ආණ්ඩුකාර මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර, නියෝජ්‍ය අමාත්‍ය අරුන් හේමචන්ද්‍ර සහ ශ්‍රී ලංකාවේ ජපාන තානාපති අකියෝ ඉසෝමාටා යන මහත්වරුන්ගේ සහභාගීත්වයෙන් ජනතා අයිතියට පත් කිරීමට නියමිතය.

ජපාන පුරවැසියන්ගේ සහ ජපාන රජයේ පරිත්‍යාගයක් ලෙස ජපන් යෙන් මිලියන 503 ක මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ ඉහත උත්සවයට සමගාමීව මෙරට තවත් රජයේ රෝහල් 14 ක ආසාධිත අපද්‍රව්‍ය කළමණාකරණ ඒකක පිහිටුවීමටද සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන ඇත.

ඒ අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලට අමතරව රත්නපුර, කුරුණෑගල යන ශික්ෂණ රෝහල් දෙකටත්, ඇඹිලිපිටිය, අවිස්සාවේල්ල, හම්බන්තොට,මන්නාරම සහ කිලිනොච්චි යන දිස්ත්‍රික් මහ රෝහල් පහටත්, රිකිල්ලගස්කඩ, මහියංගනය, පුත්තලම,මීරිගම, මැදිරිගිරිය,වැලිකන්ද යන මූලික රෝහල් හයටත්, නාකුලුගමුව දිසා රෝහලෙත් මෙම අති නවීන ආසාධිත අපද්‍රව්‍ය දාහක යන්ත්‍ර ස්ථාපි කර ඇත.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහල් පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති ආසාධිත අපද්‍රව්‍ය දාහක යන්ත්‍රයෙන් පැයකට අසාධිත අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 162 ක් දහනය කිරීමේ හැකියාව ඇත. මෙවැනි යන්ත්‍ර 05ක් සහ පැයකට අසාධිත අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 58 ක් දහනය කළ හැකි යන්ත්‍ර 10 ක් මෙම ව්‍යාපෘතියට ඇතුළත් ය. රෝහලේ අවශ්‍යතාවය අනුව මෙම යන්ත්‍ර ස්ථාපනය කර ඇත.

දීප්ති විජේතුංග
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය මාධ්‍ය ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.